# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 ජූලි මස 07 වන දින

## II වන කොටස

## අතිරේකය

(2023.07.07 දින නිකුත් කරන ලදී)


# විශේෂ වෙළඳ භාණ්ඩ බදු (සංශෝධන)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉරාන් වික්‍රමරත්න මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මඟින් 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය හෝ 5 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගයක් පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසුව පමණක් බලාත්මක වන බවට සහතික වන පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

# විශේෂ වෙළඳ භාණ්ඩ බදු
# (සංශෝධන)

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මෙම පනත 2023 අංක        දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2007 අංක 48 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 7 වන වගන්තියේ (i) සිට (iv) දක්වා වූ ඡේද ඉවත් කර ඒ වෙනුවට එම වගන්තියේ (i) වන සහ (ii) වන ඡේද ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(i) ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසුව හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ii) පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසුව පමණක් බලාත්මක විය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.